මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.06. 21

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2022

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්

<u>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් වෙත නිලධාරීන් කැඳවීම සීමා කිරීම.</u>

රට තුළ පවතින ඉන්ධන සපයා ගැනීමේ සීමාවන් හේතුවෙන් ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ මතුව ඇති ගැටලු මෙන්ම ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ඉදිරියේදී රට තුළ ඇතිවිය හැකි ගැටලුකාරී තත්ත්වය සැලකිල්ලට ගනිමින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2022.06.15 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2022 හා 2022.06.17 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022 මගින් ලබා දී ඇති උපදෙස් වලට සමගාමීව රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධයෙන් මෙම උපදෙස් නිකුත් කෙරේ.

2. බැංකු සේවා, ජලය, විදුලිය, ඉන්ධන, සෞඛ්‍ය, ඖෂධ සැපයීම, ප්‍රවාහන, පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම, වරාය සහ ගුවන්තොටුපොළ වැනි අත්‍යාවශ්‍ය සේවා සපයනු ලබන ආයතන සහ ව්‍යාපාර කටයුතුවල නිරත රාජ්‍ය ව්‍යවසායන් සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධානයන් අදාල නොවේ. කෙසේ වුවද, තම දෛනික ව්‍යාපාර කටයුතු වලට බාධාවක් ඇති නොවන පරිදි හා එමගින් පාරිභෝගික භාණ්ඩ හා සේවා සැපයුම් සම්බන්ධයෙන් බාධාවක් නොවන පරිදි මෙහි සඳහන් විධිවිධාන පිළිබඳව ආයතන ප්‍රධානියාට තීරණ ගත හැකිය.

3. අංක 2හි සඳහන් ආයතනයන් හැර අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන් 2022.06.24 දින සිට මාස 03ක කාලයක් සඳහා සෑම සතියකම සිකුරාදා දිනය නිවසේ රැඳී සිට තම ගෙවත්තේ ආහාර බෝග වගා කිරීම සඳහා පහත සඳහන් විධිවධානයන්ට යටත්ව කටයුතු කළ යුතුය.

I. සිකුරාදා දිනයේ වසා තබන ආයතන, කිසියම් අවස්ථාවක සිකුරාදා දින විවෘත කර තැබීම අවශ්‍ය වේ නම් ඒ සඳහා අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ විශේෂ අනුමැතියක් ලබා ගත යුතුය.

II. මෙසේ ආයතනය වසා තබන දිනය තුළ දී තම ආයතනයේ සේවකයන් ගෙවතු වගාව හෝ කෙටිකාලින ආහාර භෝග නිෂ්පාදනයේ යෙදෙන ලෙස දිරිමත් කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ. කෙසේ වුවද, වගා කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් කිසිදු ආයතනයක් විසින් නොමිලේ හෝ සහනදායී ක්‍රමයට සිය සේවකයන් වෙත ලබා දීම සිදු නොකළ යුතුය.

III. සිකුරාදා දිනයේ වසා තබන ආයතන එම වසා තැබූ සිකුරාදා දිනයේ හෝ ඉන් පසුව එළඹෙන සෙනසුරාදා හෝ ඉරිදා යන දින වලදී රාජකාරි කටයුතුවල නොයෙදිය යුතුය.

IV. සතියේ වැඩ කරන දින 5 තුළට සිකුරාදා දිනය නොවන රජයේ / වෙනත් නිවාඩු දිනයක් හෝ දින කිහිපයක් යෙදුනහොත් එම සතියේ සිකුරාදා දිනය සාමාන්‍ය වැඩ කරන දිනයක් සේ සලකා ආයතන විවෘත කළ යුතුය.

5. පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් පොදු හෝ පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයක් උපයෝගී කොටගෙන ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම දුෂ්කර කටයුත්තක් වීම සැළකිල්ලට ගනිමින්, කාර්යාල විවෘත නොකරන ලෙස උපදෙස් ලබා දී ඇති සිකුරාදා දිනයට අමතරව සතියේ ඉතිරි වැඩ කරන දින වලද 2022.06.22 සිට ක්‍රියාත්මක වන පරිදි සති දෙකක කාලයක් කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කර නිවසේ සිට රාජකාරි කිරීමට අවස්ථාව ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව, පහත සඳහන් නියමයන්ට අනුව මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

I. ආයතනවල කාර්යයන් බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය සේවයට කැඳවිය යුතු අතර එසේ කැඳවන අවස්ථාවේදීද සේවා මුර ක්‍රමයක් හෝ වෙනත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.

II. එසේ සේවා මුර ක්‍රමයක් හෝ විධිමත් ක්‍රමවේදයක් සැකසීමෙන් පසු යම් නිලධාරියෙකු සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය නිලධාරියාගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතුය.

III. සේවා මුර ක්‍රමයක් හෝ සේවයට කැඳවීමට අනුගමනය කරන වෙනත් ක්‍රමවේදයකට අනුව සේවයට නොකැඳවූ දිනයකදී වුවද සෑම නිලධාරියෙකුම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිය රාජකාරි කටයුතුවල යෙදිය යුතුය.

IV. ඉහත I - III ට අනුව කටයුතු කරන ආකාරය ආයතන ප්‍රධානීන් විසින් තීරණය කළ යුතු අතර ව්‍යාපාරික ආයතන සම්බන්ධයෙන් එහි මූල්‍ය තත්ත්වයට හා පැවැත්මට වන බලපෑම නිසි පරිදි තක්සේරු කොට ඒ අනුව මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම සම්බන්ධයෙන් තීරණය කළ යුතුය.

6. එසේම, සිය ආයතනවල ව්‍යවස්ථාපිත වගකීම් සහ වාණිජ අරමුණු කාර්යක්ෂම හා සඵලදායී ලෙස පවත්වාගෙන යාම අදාල ආයතනයන්හි කළමනාකරණය සතු වගකීමක් බවද වැඩි දුරටත් අවධාරණය කෙරේ.

7. මෙම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන අංක 011-2484627 මඟින් රාජ්‍ය ව්‍යාපාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසිය යුතුය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන

භාණ්ඩාගාර ලේකම්